ආඩම්බරකාර කාඩ්බර්ඩය

රංගන ශිල්පියා කියන්නෙ රංගනයක් ඉදිරිපත් කරන කෙනෙක්. හැබැයි එයා ඉදිරිපත් කරන්නෙ මවාගත්තු හරි මවා පෙන්වන හරි රංගනයක් නෙවෙයි. කොටින්ම අපි මෙහෙම හිතමුකො. රංගනය කියන්නෙ කිසියම් නිර්මාණයක ප්‍රතිනිර්මාණයක්. කොහෙන්ද අපිට මේ ප්‍රතිනිර්මාණය කරන්න අවශ්‍ය නිර්මාණ වලට ඕන කරන දේවල් එන්නෙ.

'මචං' සම්මානය ගැන කතා කරමුද?

මචං සරසවිය සම්මානය ගැන සතුටුයි. මේ කිසා ඇතිවෙන්නත් පුලුවන්. නැති වෙන්නත් පුලුවන්.

ඇතිවෙනව නම් ඒකට හේතු?

සම්මානයේ ගෞරවය නම්මුව ආරක්ෂා කර ගැනීම. ඉදිරි රංගනයන් පිළිබඳ හොඳ අවබෝධයකින් මතා තක්සේරුවකින් සිටීම.

ඒ කියන්නේ ඔබ සම්මානයක් ගන්නු නම්වෙක් කියල හැම කිස්සෙම හිතනවා.

ඔව්. මම දන් සම්මානනීය නම්වෙක්. මචං චිත්‍රපටයේ ස්ටැන්ලි ගේ රංගනය කිසා, නමුත් සම්මාන ලැබුවෙ ස්ටැන්ලි චරිතය නිරූපණය කළ නම්වාට. ඒ නම්වා මමයි. මගේ නම ධර්මප්‍රිය ඩයස්. මින් ඉස්සරහට රඟපාන්නෙ ධර්මප්‍රිය ඩයස් මිසක් ස්ටැන්ලි නෙවෙයි. රඟපාන චරිතය කුමක් වුවත් මා රඟපෑ යුත්තෙ දැනෙන රංගනයක්. සම්මාන ලබන ඕනම කෙනෙකුට ඉතිහාසය ලැබෙනවා ආඩම්බරයක්. අන්න ඒ ආඩම්බරය තුළ ඉඳගෙන සාඩම්බර ඉදිරිපත් කිරීමක් කළ යුත්තෙ කොහොමද කියලා හිතන එක නම් මහා හරියට වටිනවා.

එතකොට සම්මානයක් නිසා නැතිවෙන්නෙ කොහොමද?

අහලා තියෙනවද කුටුස්සගෙ කරේ රත්තරන් බැන්දාම වුණේ මොකක්ද කියන කතාව. මම කිව්වෙ අන්න ඒ වගේ තත්ත්වෙකට පත්වුණාම වෙනදේ ගැනයි.

මචං කොහොමද?

හොඳට විඳිනවා, ජීවත් වෙනවා. මුදුත්තු පරිසරයක පරිපූර්ණ කතාවක්. කරුමෙ තියන්නෙ මේ අපේ සමහරු දන්නෙ නෑ මචං ලා වගේ කට්ටිය ඉන්නවා කියලා. මුදුත්තු තියෙනවද කියලා.

ඕක මෙහෙම වෙන්න බැරිද?

දන්නවා. හැබැයි නොදන්නවා වගෙ ඉන්නවා.

හරියට හරි, ඒක තමයි ඇත්ත.

ඔබ ඒ ඇත්ත ගැන කතා කරන්න බයද?

අපෝ නෑ, මම මොකටද බයවෙන්නෙ. මම මේ පොළොවෙ පය ගහලා ජීවත්වෙන කෙනෙක්. ධර්මප්‍රිය ඩයස් කියන්නෙ මේ අනිත් අය වගේ ජීවත්වෙන කෙනෙක්. නමුත් විශේෂයි. ඒ මම රංගන ශිල්පියෙක් හින්දා.

කොහොමද රංගන ශිල්පියෙක් විශේෂ වෙන්නෙ?

රංගන ශිල්පියා කියන්නෙ රංගනයක් ඉදිරිපත් කරන කෙනෙක්, හැබැයි එයා ඉදිරිපත් කරන්නෙ මවාගත්තු හරි මවා පෙන්වන හරි රංගනයක් නෙවෙයි. කොටින්ම අපි මෙහෙම හිතමුකො. රංගනය කියන්නෙ කිසියම් නිර්මාණයක ප්‍රතිනිර්මාණයක්. කොහෙන්ද අපිට මේ ප්‍රතිනිර්මාණය කරන්න අවශ්‍ය නිර්මාණ වලට ඕන කරන දේවල් එන්නෙ.

ඇත්තටම කොහෙන්ද?

මේ සමාජයෙන්. අපි ජීවත්වෙන මේ සමාජයෙන්. මේ සමාජයේ ඔබත් ඉන්නවා. මමත් ඉන්නවා. තව හැමෝම ඉන්නවා. ඒ හැමෝම විවිධයි. වෙනස්. හවුරුවත් එකිනෙකාට සමාන නැහැ. අසමාන මේ සමාජයේ තියෙන අසමාන මේ ජීවිතවලට තියෙනවා එක එක ගැම්මවල්.

මොකද්ද ඔය කියන ගැම්ම?

ඊට කියන්නේ සමාජ ගැම්ම කියලා.

දන් ඔබත් ඔය සමාජ ගැම්මෙන් පෙළෙන උණ කාරයෙක්ද?

ඔව්. මට සමාජ ගැම්මකුත් තියෙනවා, පොඩි උණකුත් තියෙනවා. ඒක ඔය අනිත් හැමෝට තියෙනවා වගේ එකක් තමයි. මේක ආවෙ ඇඟ ඇතුළෙන්.

මොකද්ද ඔය ඇඟ ඇතුළෙන් එනදේ. ඒකට කියන්නෙ දේශපාලන උණ කියලද?

ඔව්. ඒක හරි, හැබැයි ඒ උණ ඇතුළේ පක්ෂ දේශපාලනය නෑ. පාට දේශපාලනය නෑ. මේ උණ ඇතුළෙ තියෙනවා මේ අපේ සමාජයේ ජීවිතවල දුක. මේ දුක කියන්නෙ මිනිසා විසින් හොවිඳිය යුතු ඒ වුණත් මිනිසා විසින් විඳින දෙයක්. ඒක හරිම පාපයක්.

ඔය පාපය අයත් වන විශේෂ තැලකය කුමක්ද?

ඒක දේශපාලන කුලකය.

ඒක නව ටිකත් පැහැදිලි කර ගනිමුද?

මේ රඟපෑ මචං එකේ ස්ටැන්ලිම ගනිමු. ස්ටැන්ලි ජීවත්වෙන පරිසරය මේ කොළඹ නගරයේ තියෙන සුපිසල් සමාජ පරිසර අස්සෙ තියෙන පරිසරයක්. ඒ සුපිසල් පරිසරය ඉන්න සමහරු දන්නෙ නෑ මේ වගේ පරිසරයක් තමන්ගෙ අල්ලපු වැටේ තිබුණද කියලා. මේක ප්‍රසිද්ධ වුණාම ඒ අය පුදුමෙන් බලනවා මේක දිහා. හරියට මැජික් එකක් දක්නා වගේ. ඊට පස්සෙ ඒ ගැන අහනවා, හොයනවා.

එහෙම කරන්නෙ උදවුවක් කරන්නද?

ඒ කිව්වෙ?

ඒ අය ඒ ඉන්න තත්ත්වෙන් මුදවගන්න වෙන්නැති.

ඔන්න ඕක තමයි අපි වරද්ද ගන්නු තැන. හැමදාමත් වරද්ද ගන්න තැන. ඔය මුදුත්තු පරිසරය අපි හඳුනාගන්න ඕන කොහොමද? සරුව කිව්වොත් දුප්පත්කම තියෙන තැන, ඇයි දුප්පත් වෙන්නෙ? ඇයි දුප්පත් කම තවමත් තියෙන්නෙ. ඒකෙ අනිත් අරුත වෙන්නෙ ඇයි පොහොසත්කම තියෙන්නෙ? ඇයි පොහොසත් වෙන්නෙ. ඊට පස්සෙ ඒ ගැන හොයනවා, විස්තර කරනවා. වාද විවාද?

ඒ අය අතරේ ස්ටැන්ලිලාට මොකද වෙන්නෙ?

ඒ අය මේකෙන් මිදෙන්න ක්‍රමයක් හොයනවා. ඒ ක්‍රමය තමයි ඉන්නා තැනින් තාවකාලික හරි ඉවත්වීම, පලායාම, වෙන තැනකට වෙන ප්‍රදේශයකට වෙන රටකට. වෙන සමාජ ස්ථරයකට මාරුවීම, මොකටත් ක්‍රම තියෙනවා.

මොනවද ඒ ක්‍රම?

අවසර ඇතුව යාම, අවසර නැතිව යාම.

ඔය අවසර නැතුව යාම භයානකයි නේද? ඒ වගේම නීති විරෝධියි. සමාජ විරෝධියි.

ඉතිං ඒකට හේතු සාධක මොනවද? තවුද ඒ අය ඒ තත්ත්වයට පත් තුළේ, ඇයි මචං ලා හිතිලොත්නෙ, ඇයි මචං ගේ පරිසරය තවමත් පවතින්නෙ, මේ ප්‍රශ්න වලට විසඳුම් නැද්ද?

ඇත්තටම නැද්ද?

තියෙනවා.

කොහේද?

වගකිව යුතු අය ගාව. නමුත් ඒවා එළියට දාන්නෙ නෑ. පෙන්වනවා විතරයි. ඒ කියන්නෙ ප්‍රදර්ශනය කිරීමක්. ඔය ප්‍රදර්ශනය පමණයි කියලා පෙන්වන දේවල් තියෙනවා නේද? ඒවා අපිට අරගන්න බැහැ. සැලිලි වලටවත් ගන්න බෑ. බලන්න විතරයි පුලුවන්. තවත් ඕනම නම් අතපත ගාන්න පුලුවන්.

එහෙමනම් ඒක දේශපාලන ප්‍රදර්ශනයක්?

ඒක හරි. මචං ලා ඒක දනගෙන හිටියා. ඒ හින්දා මචංලාට දකුණා මේ රට තුළ ඉදීමෙන් මේ ප්‍රශ්න විසඳෙන්නෙ නැහැ. ඒ හින්දයි රටින් පැන්නෙ. මේ තත්ත්වය දේශපාලන හේතු උඩ සිදුවෙන දෙයක්. ඔය දේශපාලන කාරණය වරද්දා ගැනීම මේ අද ඊයෙ වුණු දෙයක් නෙමෙයි. ඉතිහාසයේ ඉඳලම වුණ දෙයක්. ඒකට මේ අපේ රට ගිලගත්තු සුද්දගෙ කාලෙටත් එහා ඉඳලා වග කියන්න ඕන. ඒ කියන්නෙ අනාදිමත් කාලයක සිටි පාලකයිනුත් මේකට හවුල්. දන් බලන්න අපි ඉතිහාසයේ කොච්චර දුරක් ඉඳලා මේ සමාජ ප්‍රශ්න වලින් මිදා විඳිනවාද? දුක් විඳිනවද? අසමාන කම් අසමගිකම් වපුරනවද? ඒ විතරක් නෙමෙයි ඒවට පොහොරත් දානවා.

අපි ඒවායෙ අස්වැන්නත් නෙළනවා. ඊට පස්සෙ ඒවායින් ආයිත් බීජ වපුරනවා. එහෙම නේද?

එහෙමම තමයි.

නාමත් ඉන්නෙ මචං තුළමද?

මෙහෙමයි. ඉන්නෙ මචං තුළ. මම ඒකෙන් අදහස් කරන්නෙ කියන්නෙ 'මචං' හා 'මචං නොවන' සමාජ පරිසරය ඇතුළෙ ජීවත්වෙන එකටයි. ඒ පරිසරයේ ඒ සමාජ ක්‍රියාකාරකම් අතරේ තෙරපෙමින් අඩු වැඩි විදියට ඒවා විඳිමින් අපි ජීවත් වෙනවා. හැබැයි ඒක නිකමම නිකම් ජීවත්වීමක් නෙවෙයි. මේ සමාජගත ක්‍රියාවලියෙ දකින දේ අහන දේ විඳින දේ හරිම පුදුම විදියට ගලපලා හදලා කපලා කොටලා අපි අපනු ඉදිරිපත් කරනවා. ඒ තත්ත්වය තුළ ඒවා දකින, අහන, විඳින අය තේරුම් ගන්නවා. අවබෝධ කර ගන්නවා මෙහෙම දේවලුත් මේ සමාජයේ තියෙනවා. තමනුත් ඒවාට අනුවෙලා ඉන්නවා කියලා, ඊට පස්සෙවත් ඒ අය මේ තත්ත්වය තේරුම් ගනිවි. ඒ වගේම තේරුම් ගියත් තේරුම් කොහියා වගේ ඉන්න අයත් ඒ ගැන හොයාවි. බලාවි. ඊට ඒක කරන්න ලේසියි. අනිත් අයට වඩා මොකද? මම රංගන ශිල්පියෙක් ගිහින්දා. ඒකයි මම කිව්වෙ සම්මානනීය රංගන ශිල්පියෙක්, ආඩම්බර සාඩම්බර කාරයෙක් කියලා.

මචං චිත්‍රපටයෙන්ස්ටැන්ලි

ධර්මප්‍රිය ඩයස් 2008 රිදී තිරයේ හොඳම නළුවා වූ වගයි

අරුණකෙල් වපේරත්න

ජයසිරි චිත්‍රසිංහ

Scan with EasyScan